## ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු

**13 ශ්‍රේණිය** | **බෞද්ධ ශිෂ්ටාචාරය II** | **කාලය පැය 3 යි**

**නම/විභාග අංක ...........................................................................................................**

**පන්තිය .....................................................................................................................**

### I කොටස

- **I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

**01. I.** චතුර්වර්ණ නිර්මාණයේදී වෛශ්‍ය වර්ණයට නියමකර තිබූ "ස්වධර්ම" මොනවාද?

**II.** නිසිපරිදි යාගයක් සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය වන බ්‍රාහ්මණ පූජක පිරිසේ සංයුතිය ලියා දක්වන්න.

**III.** නිඝණ්ඨ නාථපුත්ත තුමාගේ ඉගැන්වීම් මොනවාදැයි ගෙනහැර දක්වන්න.

**IV.** කාන්තාවන් පිළිබඳව බ්‍රාහ්මණයින් දැක්වූ ආකල්පය බුදු සමයෙන් විචාරයට ලක්වන ආකාරය දැක්වෙන සාධක 03 ක් ගෙනහැර දක්වන්න.

**V.** බුද්ධකාලීන භාරතයේ පැවති ප්‍රධාන රාජණ්ඩු හතර නම්කොට එම රාජ්‍යවල පැවති මූලික ලක්ෂණ පෙන්වා දෙන්න.

**02.I.** බ්‍රාහ්මණ මූලාශ්‍රවලට අනුව සතර වර්ණයේ ප්‍රභවය දක්වා ඇත්තේ කෙසේ ද?

**II.** බුද්ධකාලීන භාරතයේ පැවති, පුද්ගලයාගේ ස්වාධීනත්වයට බාධා පැමිණ වූ ආගමික ඉගැන්වීම් දෙකක් හඳුන්වා දෙන්න.

III. "දස රාජ ධර්ම" පිළිවෙලින් දක්වන්න.

**IV.** සතර සංග්‍රහ වස්තුවලට අයත් "දානය" යන්නට ධර්මානුකූල විවරණයක් සපයන්න.

**V.** සිඟාලෝවාද සූත්‍රයෙන් දැක්වෙන පෙරදිග දිශාව නියෝජනය කරන සමාජ සංස්ථාවට අයත් යුතුකම් හා වගකීම් ගෙනහැර දක්වන්න.

**03. I.** දස කුසල් නම්කොට කායික, වාචසික හා මානසික වශයෙන් ප්‍රභේද කොට දක්වන්න.

**II.** පංචශීලයට අයත් එක් ශීලයක් නම්කොට, එහි විරතිය සමාදානය ඇතිකරගන්නා ආකාරය නිදසුනක් ඇසුරින් පෙන්වා දෙන්න.

III. බෞද්ධ මූලාශ්‍රයන්ට අනුව ධනය ඉපයීම හා පරිභෝජනය පිළිබඳ ඉගැන්වීම් ගෙනහැර දක්වන්න.

IV. බුදුසමය තුල "ආකාරවතී ශ්‍රද්ධාව" ට හිමි තැන පහදන්න.

V. ස්වභාවික සෞන්දර්ය හා නිර්මාණ සෞන්දර්ය බුදු දහමින් ප්‍රතික්ෂේප වන්නේ නැත. ඒවා ඇගයීමට ලක්කොට ඇති ආකාරය සූත්‍රාන්තගත කරුණුවලට අනුව පෙන්වා දෙන්න.

## <u>II වන කොටස</u>

04.I. බුදුරජාණන් වහන්සේගේ ත්‍රිවිද්‍යා ඥානය නම් කරන්න.

II. බුදුරජාණන් වහන්සේගේ මහා ප්‍රඥාව ප්‍රකට වන අවස්ථා දෙකක් සංක්ෂිප්තයෙන් දක්වන්න.

III. බුද්ධ චරිතයෙන් ප්‍රකට වන කාල කළමනාකරණ ලක්ෂණ පුද්ගල ජීවිතයක සාර්ථකත්වයට උපයෝගී කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

IV. නව අරහාදී බුදුගුණ පිළිවෙලින් ලියා දක්වා ඒවා කෙටියෙන් හඳුන්වන්න.

05.I. උට්ඨානවතෝ සතිමතෝ ............ යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර එහි තේරුම ලියා දක්වන්න.

II. ආනන්ද මහරහතන් වහන්සේ විසින් බුදුරජාණන් වහන්සේගේ නිත්‍ය උපස්ථායක ධූරයට පත්වීම සඳහා උන්වහන්සේට ඉදිරිපත් කල ප්‍රතික්ෂේප හතර ලියා දක්වන්න.

III. නූතන ගෘහස්ත සමාජයට, විශාකා සහ නකුල මාතා යන උපාසිකාවන්ගේ චරිතානුසාරයෙන් ගතහැකි පූර්වාදර්ශ මොනවාදැයි පෙන්වා දෙන්න.

IV. බුදු දහමේ එන ස්වාමීත්වය, ස්වාධීත්වය, ස්වඡන්දතාව හා වගකීම යන සංකල්ප කෙටියෙන් හඳුන්වන්න.

06.I. බුදුරජාණන් වහන්සේ තම ශාසනයේ ප්‍රථම රහතන් වහන්සේලා හැට නම අමතා කල ප්‍රකාශය ලියා දක්වන්න.

II. බුද්ධ සාසනයේ තනතුරු ලාභී උපාසකවරුන් දෙදෙනෙකු සහ උපාසිකාවන් දෙදෙනෙකු ඔවුන්ගේ තනතුරු සහිතව නම් කරන්න.

III. ශාසනයේ චිරස්ථිය උදෙසා බුද්ධකාලීන රජවරුන්ගෙන් සහ සිටුවරුන්ගෙන් ලැබුණු අමිල දායකත්වය සන්නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.

IV. උපමානුසාරයෙන් දහම් දෙසීමෙහිලා බුදුරදුන් තුළ පැවති ශක්‍යතාව උදාහරණ දෙකක් මඟින් පැහැදිලි කරන්න.

07.I. ධර්ම සංගායනාවක් යනු කුමක් දැයි පැහැදිලි කරන්න.

II. සම්බුදු සසුනේ චිර පැවැත්ම උදෙසා පළමු ධර්ම සංගායනාවෙන් සිදු වූ මෙහෙය ඇගයීමට ලක්කරන්න.

III. ශාසන ව්‍යාප්තිය කෙරෙහි තෙවන සංගායනාව බෙහෙවින් වැදගත් කමක් උසුලයි. ඊට පූර්ණ රාජ්‍ය අනුග්‍රහය ලබාදුන් අශෝක අධිරාජයාගේ ශාසනික මෙහෙවර පිළිබඳ ඇගයීමක් කරන්න.

IV. වජ්ජිපුත්තක භික්ෂූන්ගේ දස වස්තුව නම්කොට, දෙවන සංගායනාව පැවැත්වූ ස්ථානය, ප්‍රධානත්වය දැරූ අය, රාජ්‍ය අනුග්‍රහය දැක්වූ අය සහ කොපමණ භික්ෂූන් පිරිසක් සහභාගි වූයේ ද යන්න පිළිවෙලින් දක්වන්න.

08. I. සමාජ ප්‍රභවය හා විකාශනය පිළිබඳ බ්‍රාහ්මණ මතය කෙටියෙන් ලියා දක්වන්න.

II. යහපත් පාලනයකට උපයෝගී වන බෞද්ධ දේශපාලන මූලධර්ම මොනවාදැයි සැකවින් දක්වන්න.

III. නාලන්දා විශ්ව විද්‍යාලයේ ප්‍රවේශය, පරිපාලන ව්‍යුහය, විෂයමාලා හා එහි මූලික වූ හිමිවරුන්, රජවරුන් පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

IV. ශ්‍රී ලංකාවේ ප්‍රාග් මහින්ද යුගයේ පැවති ආගමික ඇදහිලි හා විශ්වාස මොනවාදැයි නම්කොට ඉන් දෙකක් පිළිබඳව විස්තරයක් සපයන්න.